සරසවි සිසුවෙකු, ජන. 17, 2023 දින කොළඹ තුරඟ තරග පිටියේදී සරසවි සිසුවියක ඝාතනය කොට පසුව දිවි තොර කරගැනීමට තැත් කිරීම සහ ඔහු පොලිස් අත්අඩංගුවට පත් වීම සමාජ මාධ්‍ය තුළත්, මාධ්‍ය තුළත් දැඩි අවධානයකට ලක්වූ සිදුවීමක් විණි. තවදුරටත්, මාධ්‍ය වාර්තා අනුව:
* සැකකරු, සිදුවීමෙන් පසුව, දිවි තොර කරගැනීමට කිහිප විටක්ම උත්සාහ ගෙන තිබිණි.
* සැකකරු අතීතයේ ද දිවි තොර කරගැනීමට උත්සාහ ගෙන තිබිණි.
* සැකකරු මානසික සංකූලතාවයකට ප්‍රතිකාර ගන්නා බව ද, සැකකරුගේ නීතීඥවරයා විසින් පෙන්වා දුනි.
* ඒ අනුව, ඔහුව ජාතික මානසික විද්‍යායතනය වෙත යොමු කොට වාර්තාවක් ලබා ගන්නා ලෙසට ද මහේස්ත්‍රාත්වරයා නියෝග කරන ලදී.
මෙම සිදුවීම වාර්තා කරනා පුවත්පත් කිහිපයක සිරස්තල පහත පරිදි වේ.
1) ඒ අනුව, මෙම සැකකරුව, ලංකාදීප පුවතෙන් "උන්මත්තක පෙම්වතා" ලෙසින් සහ මව්බිම පුවතෙන් "සාහසික පෙම්වතා" ලෙසින් දැක්වීම, ඔහුව සිදුවීම සම්බන්ධයෙන් නිතිමය තීන්දුවක් ලැබීමට පෙරාතුවම දුෂ්ටත්වයකින් හැඟවුම්කරණය කිරීමක් (demonisation) නොවන්නේ ද?
2) මෙම සිරස්තල ඔස්සේ, මෙම ඝාතන-දිවි තොර කරගැනීමට උත්සාහ කිරීමේ සිදුවීම හැඟීම් කළඹවන සුළු ආකාරයකින් ඉදිරිපත් වී ඇතැයි ඔබ නොසිතන්නේ ද? එය අනුකාරක සිදුවීම් වලට ද හේතුවක් නොවනු ඇති ද?
3) මාධ්‍යයක් යම් සිදුවීමක් සම්බන්ධයෙන් හැඟීම් කළඹවන සුළු ලෙසින් වාර්තා කරමින්, සිදුවීමේ සැකකරුව දුෂ්ටත්වයකින් යුතුව දක්වමින්, සිදුවීම සම්බන්ධයෙන් තීන්දු තීරණ ලබාදෙන්නේ නම්, එය වගකීම් සහගත මාධ්‍යකරණයක් යැයි ඔබ සිතන්නේ ද?
4) ඝාතන-දිවි තොර කරගැනීමට උත්සාහ කිරීමක් ලෙසින් ගත හැකි මෙවැනි සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, හදිසි උපකාරක අංක සඳහන් කිරීම අත්‍යවශ්‍ය නොවන්නේ ද?
හදිසි උපකාරක අංක:
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*1333-CCCline
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926



2023 ජනවාරි 22 දින සිංහල පුවත් දත්ත ඇසුරිනි.